## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

කොළඹ මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොළඹ මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය කිරීමේ පදනම කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

**1.5 වෙනත් නෛනික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.**

**(අ) මහා නගර සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.**

**(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.6 ජේදයේ 1.6.1(ii) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.**

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම.**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **ප්‍රමිතියේ 3.20 වගන්තිය ප්‍රකාරව වාර්තාකරණ දිනයට පසුව මාස දොළහක් තුලදී වගකීම් නිරවුල් කිරිම නියමිතව තිබිම අස්ථිත්වයක් ජංගම වගකීමක් ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් සභාව විසින් 2023 වර්ෂය තුල ගෙවිය යුතු ආසියානු සංවර්ධන බැංකු ණය වාරිකයන්හි එකතු වටිනාකම රු.201,632,572 ක් ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.** | **ණය ගිවිසුම ප්‍රකාරව 2023 වර්ෂයේ සිට ගෙවිය යුතු ණය මුදලින් ආසන්නතම ඊළඟ වර්ෂයට අදාළ වාරිකය ජංගම වගකීම් ලෙසත් ඉතිරිය ජංගම නොවන වගකීම් ලෙසත් හඳුනා ගන්නා බව** | **ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.** |
| **(ආ)** | **ප්‍රමිතියේ 6 වන පරිච්ජේදයෙහි සඳහන් පරිදි දේපල පිරියත හා උපකරණ ක්ෂය කල යුතු වුවත් ප්‍රමිතිය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට සභාවේ මූල්‍ය ප්‍රකාශනය තුල ඇතුලත් වූ රු.25,918,446,539 වූ දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරිම සිදුකර නොතිබුණි.** | **නිසි පිරිවැය සහිතව යාවත්කාලීන වූ වත්කම් ලේඛනයක් සභාව සතුව නොමැති නිසා වත්කම් ප්‍රත්‍යාගණනය ආරම්භ කර ඇති අතර ප්‍රත්‍යාගණිත අගය මත යාවත්කාලීන වූ ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කරඑම අගය ,න් 2023 වර්ෂයේ අවසන් ගිණුම්වලට වර්ෂයේ 2024 ඇතුළත් කර ,සිට වත්කම් ක්ෂය කිරීමටත් මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කිරීමත් සිදු කරන බව.** | **ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.** |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගන්නා ලද ඩොලර් මිලියන 231.52 ක ණය මුදලක් භාවිතයෙන් කොළඹ මහා නගර සභාවේ මලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දින විට රු.23,209,967,369 ක මුදලක් ආයෝජනය කර ඇති අතර එයින් රු.19,971,109,470 ක මුදලක් ගිණුම්ගත කිරීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කර නොමැති අතර කොළඹ මහා නගර සභාව විසින් ආපසු ගෙවීමට ගිවිසුම්ගත වී ඇති රු.3,238,871,899 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | දින සාකච්ඡාව 2023.05.25 වර්ෂයේ දී අවශ්‍ය 2023 අනුව ගැලපීම් ඉදිරිපත් කරන බව. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොළඹ මහා නගර සභාව වෙත පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යංශය වෙතින් නව ගිනි නිවීමේ රථ 13ක් ලැබීම හේතුවෙන් කොළඹ මහා නගර සභාව භාවිතා කරමින් පැවති එකතු වටිනාකම රු.123,105,831 ක් වූ ගිනි රථ 15ක් වෙනත් පළාත් පාලන ආයතන වලට පවරා දී තිබුණද ඊට අදාල වටිනාකම මෝටර් වාහන ගිණුමට ගැලපීම් කර නොතිබුණි . | පවරා දුන් වාහන වල නිවැරදි පිරිවැය සොයා ගැනීමට නොහැකි වීමත් ඇතැම් වාහන සභාවේ වත්කම් තුළට ඇතුළත් නොවීමේ ගැටළුව නිරාකරණය කර 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කරන තෙක් 2022 අවසාන ගිණුම් වල සටහනක් මඟින් හෙළිදරව් කර ඇති බව. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 18 යටතේ රු.5,892,897,771 ක් මෝටර් වාහන වටිනාකම ලෙස දක්වා තිබූ අතර විගණනයට ඉදිරිපත් කළ මෝටර් වාහන ලේඛන අනුව එහි වටිනාකම රු.4,122,824,893 ක් විය. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සහ මෝටර් වාහන ලේඛන අනුව මෝටර් වාහන වටිනාකම අතර රු 1,965,920,343 ක වෙනසක් තිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණන කමිටු හරහා මෙම වෙනසට හේතු අනාවරණය කොට ගෙන එළඹෙන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් ගැලපීම් කරන බව. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදීම හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 කාශනය සමඟ ප්‍රදිනට මුලා ඉදිරිපත් කළ වරිපනම් සාරාංශ වාර්තාව පිළියෙල කිරිම සඳහා උපයෝගී කරගෙන තිබූ විස්තරාත්මක වාර්තා වල ඇතුලත් අවිනිශ්චිත ශේෂයන් වල එකතු වටිනාකම රු **34,609,149**.ක් විය . එකී වටිනාකමෙන් හඳුනාගත් ශේෂයන් නිරවුල් කිරිමට කටයුතු දිනට 31 දෙසැම්බර් 2022 නොකර ලැබිය යුතු වරිපනම් එකතු වටින◌ාකම රු **4,316,776,152**.ක ගණනය නිවැරදි නොවීය. | දිනට වරිපනම් 31 දෙසැම්බර් 2022 සාරාංශ වාර්තාවේ අවිනිශ්චිත ශේෂයන් වල එකතුව **9,230,844.32**.රුකි. බැංකු මඟින් සෘජුව ගෙවීමේදී වරිපනම් බදු ගෙවනු ලබන දේපළ පිළිබඳ නිවැරදි තොරතුරු හඳුනාගත නොහැකි අවස්ථාවලදී , නිවැරදි දේපළ අංකය හඳුනා ගන්නා තෙක් එම වරිපනම් වටිනාකම අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කරනු ලබයිවරිපනම් . ආදායම ලෙස ගිණුම් ගතව ඇති එම වර්ෂයේ 2022 ආදායමෙන් අවිනිශ්චිත ගිණුමේ අවසානය තෙක් ක් 58 පැවති ලැබීම් වලින් දේපළ **1,171,796.75** .රු)ක්හඳුනාගෙන ( නිවැරදි කේවල ගිණුම් වලට ගලපා ඇතිඅතර ඉදිරි කාලය තුළ ඉතිරි අවිනිශ්චිත ශේෂයන්ගේ වටිනාකම් ද හඳුනා ගැනීමෙන් පසුඅදාළ , කේවල ශේෂ ගිණුම් වලට ගැලපීම් කිරීමට කටයුතු කරන බව සහ වරිපනම් නොගෙවීම මත මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව දේපළ තහනමට ගැනීමේදී මෙම ගෙවීම් වලට අදාළව ගැටලු ඇතිවිය හැකි බැවින් මෙම ගිණුම පවත්වාගෙන යායුතු බව. | අවිනිශ්චිත ශේෂයන් කඩිනමින් හඳුනාගෙන ගිණුම් යාවත්කාලීන කිරිමත් හිඟ වරිපනම් බදු සම්බන්ධව මහා නගර සභා ආඥා පනත අනුව කටයුතු කිරිමත් කළ යුතුය. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කරන ලද පද්ධති සාරාංශ වාර්තාව අනුව වත්කම් වටිනාකම රු **7,344,181,805**.ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 කාශනය අනුව එකතු ප්‍රදිනට මුලා **25,918,446,539**.වටිනාකම රුක් විය **18,574,264,734**.ඒ අනුව රු .ක වෙනසක් නිරික්ෂණය වූ අතර මුලා ප්‍රකාශනය අනුව වත්කම් වර්ගීකරණය එක් ආකාරයකටත් පරිගණක පද්ධතිය භාවිතයෙන් ලබාදුන් වත්කම් වර්ගීකරණය තවත් ආකාරයකටත් ඉදිරිපත් කර තිබුණි. | වත්කම් වර්ගීකරණයේ ගැටලු පවතී යන්න හා එකඟ වන අතර පරිගණක මෘදුකාංග පද්ධතිය මගින් ලබා ගන්නා සාරාංශ වාර්තාවට රු.**15,515,316,349** ක වත්කම් එකතු විය යුතු වේඑවිට ඔබ විසින් . පෙන්වා දෙන ලද වෙනසට වඩා අඩු වෙනසක් (රු.**3,058,948,385**) නිරීක්ෂණය වේ මන්දයත් .LAIN මගින් පද්ධතිගත වන ස්ථාවර වත්කම් පමණක් ඔබ විසින් ඉදිරිපත් කර ඇති පරිගණක මෘදුකාංග පද්ධතිය මගින් ලබා ගන්නා ලද සාරාංශ වාර්තාවේ අන්තර්ගත බව. | වත්කම් කළමනාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරිමත් විගණනය සඳහා විමර්ශනය කිරිමේ **(Review Only)** පහසුකම ලබාදීම සලසාදීමත් කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වත්කම්<br>වගකීම්<br>වියදම්<br>ආදායම | 35,847,745,839<br>10,988,421,308<br><br>10,534,394,892<br>13,440,288,669 | කොළඹ මහා නගර සභාවේ සියළු ගිණුම්කරණ කටයුතු Municipal Council Accounting System (MCAS) නමින් පරිගණක පද්ධතියක පවත්වා ගෙන යන බවට පොදු ලෙජරය මෘදු පිටපතක් ලෙස විගණනයට ඉදිරිපත් වුවද පද්ධතියට ප්‍රවේශ වීමට (Review Only) අවශ්‍ය පහසුකම් නොසැලසීම හේතුවෙන් පද්ධතියේ ඇති තොරතුරු වල නිවැරදිතාවය හා පද්ධති පාලනයන් පිළිබඳ තහවුරු කර ගැනීමට නොහැකි වීමෙන් රු.35,847,745,839 වත්කම් සහ රු.10,988,421,308 වගකීම් සත්‍යාපනය කිරිමටත් රු.10,534,394,892 වූ වියදම් හා රු.13,440,288,669 ක ආදායම සංනිරික්ෂණය කිරිමට නොහැකි වීමෙන් විගණන විෂය පථය සීමා කිරිමත් සිදුකර තිබුණි. | කඩිනමින් ලබා දීමට කටයුතු කරන බව. | විගණනයට අවශ්‍ය තහවුරු කර ගැනීම් සඳහා බාධාවකින් තොරව පරිගණක පද්ධතියට ප්‍රවේශවීමට හා විමර්ශනය කිරිමට (Review Only) අවස්ථාව සලසා දිය යුතුය. |
| (ආ) | තොග | 679,292,707 | මූල්‍ය ප්‍රකාශනය අනුව 2022 දෙසැම්බර් 31 දිනට තොග වටිනාකම රු.679,292,707 ක් විය. තොග සමීක්ෂණය සඳහා සුදුසු සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණු අතර තොග සමීක්ෂණයට පෙර සමීක්ෂණය කරන දිනයක් පිළිබඳව විගණක දැනුවත් නොකිරීම හේතුවෙන් තොග වටිනාකම සත්‍යාපනය කළ නොහැකි විය. | 2023 වර්ෂයේදී තොග සමීක්ෂණ සිදු කරන දින පිළිබඳව විගණක දැනුවත් කරන අතර අනෙකුත් නිවැරදි කිරීම් සිදු කිරීමට සටහන් කර ගත් බව. | විගණනයට අවශ්‍ය තහවුරු කර ගැනීම් සඳහා මීලඟ තොග සමීක්ෂණයට පෙර විගණක දැනුවත් කර සමීක්ෂණය කරනු ලබන දිනයක් පිළිබඳ එකඟතාවයක් ලබා ගැනීම කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **685,620,542** | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරිමේදී රු.**685,620,542** ක් අතිරික්තය සහ ඌනතා ගිණුමේ ගැලපීම් ලෙසද, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ පෙර වර්ෂයේ වැරදි ලෙස රු.**682,562,364** ක් සමුච්චිත අරමුදලටද ගැලපීම් කර තිබුණද එම වටිනාකම ගණනය කළ ආකාරය සහ ගණුදෙනුවල ස්වභාවය පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එම වටිනාකම ගණනය කිරිමේ නිරවද්‍යතාවය තහවුරු කිරිමට නොහැකි විය. | ගනුදෙනු සංඛ්‍යාව විශාල වීමත්, සම්බන්ධවන අංශ සංඛ්‍යාව විශාලවීම හේතුවෙන් ගනුදෙනුවෙන් ගනුදෙනුව වෙන වෙනම විශ්ලේෂණය කර මුදල් ප්‍රවාහයක් පවතී ද නැද්ද යන්න හඳුනා ගැනීම දුෂ්කරය. එමෙන්ම දැනට භාවිතා කරන පරිගණක පද්ධතිය (MCAS) හරහා ද සෘජුව හඳුනාගත නොහැක. දෙපාර්තමේන්තු මට්ටමින් සාරාංශ වාර්තාවක් ඉදිරිපත් කිරීමට සටහන් කර ගත් බව. | ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරිම සහ විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

**1.7** අනුකූල නොවීම

**1.7.1** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි හා 2020 දිනැති රාජ්‍ය 28 අගෝස්තු මුදල් චක්‍රලේඛ අංක 2020/01 | | | |

| | | | | |
|---|---|---|---|---|
| (අ) | මු3 රෙ.9) 6ඇ( | නිකුත් කරන ලද නමුත් මාස 06 ක කාලය තුළදී ගෙවීමට ඉදිරිපත් නොකළ රු.28,159,481 ක් වටිනා චෙක්පත් 548 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම චෙක්පත් වලින් රු 9,155,741.ක වටිනාකමට අදාළ චෙක්පත් නිරවුල් කර ඇති අතර ඉතිරි චෙක්පත් ද ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතින බව. | මාස 06 ක කාලයක් තුලදී ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 03/2018 හා 2018 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 II ඡේදය | වැඩ බැලිම වැනි විකල්ප ක්‍රියාමාර්ග වලින් දැනට සේවයේ සිටින නිළධාරීන්ගෙන් ඉටුකරගත නොහැකි වූ අත්‍යවශ්‍ය තනතුරු වලට පමණක් විශ්‍රාමික නිළධාරියකු පත්කළ යුතු වුවද සුදුසුකම් සහිත නිළධාරීන් හයදෙනෙකු සිටියදී බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අංක GOS/ADM/13/5/24 හා 2023 ජනවාරි 03 දිනැති මික ලිපිය මගින් විශ්‍රා ත් නිළධාරියකු කොන්ත්‍රා 03 පදනමින් මාසකකාල පරිච්ඡේදයක් සඳහා නියෝජ්‍ය නාගරික තක්සේරු II ශ්‍රේණියේ තනතුර සඳහා පත්කර දීමනා ගෙවා තිබුණි. | වයස 60 සම්පූර්ණ වීම මත වැඩ බලන නාගරික ම තක්සේරුකරු විශ්‍රා ගැන්වූ අතර එම නිලධාරියාම ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය මත මාස 3 ක කාලයක් සඳහා නාගරික නියෝජ්‍ය තක්සේරුකරු වශයෙන් පත්කර රාජකාරි ඉටුකර ඇති බව. | නැවත පත්කිරිම සඳහා ආණ්ඩුකාරවරයා වෙත නිර්දේශ යැවීමේදී චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මහා නගර සහා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග සඳහා වූ අංක 2155/6 දරන 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය | (i) ගැසට් පත්‍රයෙහි 62 වන නියෝගය ප්‍රකාරව මහා නගර සහා අරමුදලට ප්‍රවර්තන වර්ෂයට අදායම් මූලාශ්‍ර වන දේපළ හඳුනා ගැනීම සඳහා වූ සමීක්ෂණයක් සිදුකොට ඊට අදාල වාර්තා සෑම වර්ෂයකම මාර්තු තිස් එක් වන දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ කොට්ඨාශ 48 කින් 19 ක සමීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර 2023 ජුනි 06 දිනට ඉතිරි කොට්ඨාශ වල සමීක්ෂණ වාර්තා ලබාදෙන ලෙස ලිඛිතව උපදෙස් ලබාදී ඇත. අනුමත කාර්ය මණ්ඩලයේ ආදායම් පරික්ෂකවරුන් 39 දෙනෙකුගෙන් 15 ක් පමණක් සභාවේ රාජකාරී කිරිම නිසා නියමිත දිනට සමීක්ෂණ | නියමිත දිනට සමීක්ෂණ කටයුතු සිදුකර ආදායම් මූලාශ්‍ර වන දේපල හඳුනා ගැනීම හා ඒ අනුව ආදායම් එකතු කර ගැනීමට ඉදිරි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතු අවසන් කිරිමට නොහැකි වි ඇති බව. | |
| **(ii)** | ගැසට් පත්‍රයෙහි **428** වන නියෝගය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් ඒ අනුව සභාව කටයුතු කර නොතිබුණි. **2020** දෙසැම්බර් **31** දිනට සභාවේ මූල්‍ය ප්‍රකාශනය අනුව වත්කම් ප්‍රත්‍යාගණනය **2022** වර්ෂයේ සිදුකරන බව සඳහන් කළද **2022** දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රකාශනය තුල වත්කම් ප්‍රත්‍යාගණනය **2024** වර්ෂයේ සිදුකරන බව සඳහන් කර තිබුණි. ඒ අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කටයුතු වසරින් වසර කල් දැමීම හේතුවෙන් වත්කම් වල සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශයට ඇතුලත්ව නොතිබුණි. | නිසි පිරිවැය සහිතව යාවත්කාලීන වූ වත්කම් ලේඛනයක් සභාව සතුව නොමැති නිසා වත්කම් ප්‍රත්‍යාගණනය ආරම්භ කර ඇති අතර ප්‍රත්‍යාගණිත අගය මත යාවත්කාලීන වූ ස්ථාවර වත්කම් ලේඛයක් පිළියෙල කරඑම අගය , වර්ෂයේ **2023** මත අවසන් ගිණුම්වලට **2024** ඇතුළත් කර වර්ෂයේ සිට වත්කම් එය ,ක්ෂය කිරීමටත් කාශන තුළ ප්‍රමූල්‍ය ගැලපීම් කිරීමත් සිදු බවත් කාරුණිකව කරන තවද මෙම .දන්වා සිටිමි කාශන ප්‍රකරුණ මූල්‍ය වල දේපළ පිරියත හා උපකරණ වලට අදාළ ප්‍රතිපත්ති යටතේද හෙළිදරව් කර ඇති බව. | වත්කම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරිම සඳහා දේපළ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරිම කළ යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම.

| විගණන නිරික්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| වර්ෂ **2016** ජුලි **01** සිට **2020** මාර්තු **31** දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් එවන ලද බදු වාර්තා අනුව **2023** මැයි **04** දිනට ගෙවිය යුතු එකතු කල අගය මත බදු වටිනාකම රු.**897,143,592** ක් වූ අතර ඒම බදු නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිගනක තොරතුරු පද්ධතිය අවශ්‍ය පරිදි සකස් කර ගැනීමට කල් ගත වීම හා අදාල සියලුම තොරතුරු පරිගනකයට ඇතුලත් කර නොතිබීම යන කරුණු හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති අතර නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | බදු හිගය නිරවුල් කර ගැනීම කඩිනම් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 202දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම 31 දෙසැම්බර් 2 2,905,893.ඉක්ම වූ ආදායම රු,767 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු 570,693,595.ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) (i) සභාව විසින් පවත්වාගෙන යන ජංගම ගිණුම් 05 කට අදාල රු.177,425,672 ක් වූ සෘජු බැර කිරිම් හෝ සාවද්‍ය බැර කිරිම් ද රු.25,509,347 ක් වූ සෘජු හර කිරිම් හෝ සාවද්‍ය හර කිරිම්ද හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි. | මෙම සෘජු බැර කිරීම් වලින් 2023.03.31 72,351,250 .දින වන විට රුක් නිරාකරණය කර සෘජු හෝ සාවද්‍ය හර කිරීම් වල වටිනාකමෙන් රු 3,898,787 . ක වටිනාකමක්ද අදාළ ගනුදෙනු නිරාකරණය කර ඇත .<br>ඉතිරි හඳුනාගත හැකි ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමටත්, හඳුනාගත නොහැකි ශේෂයන් අනුමැතියකින් පසු ගිණුම් වලින් ගැලපීම් කිරීමටත් සටහන් කර ගත් බව . | සෘජු හෝ සාවද්‍ය හර කිරීම් සහ බැරකිරීම් හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) ජංගම ගිණුම් 03 ක තැන්පත් කරන ලද නමුත් උපලබ්ධි නොවූ රු1,014,644. ක් වූ තැන්පතු 46 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ පිළිබඳව පරික්ෂා කර අදාළ අංශ වෙත දැනුවත් කර ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | උපලබ්ධි නොවූ චෙක්පත් වලට අදාලව මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපති විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන | 2022 බිල් කළ ආදායම රු.මිලියන | 2022 රැස්කළ ආදායම රු.මිලියන | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.මිලියන | 2021 ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන | 2021 බිල් කළ ආදායම රු.මිලියන | 2021 රැස්කළ ආදායම රු.මිලියන | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.මිලියන |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 5,090.4 | 4,306.7 | 4,113.9 | 4,368.2 | 4,960.5 | 4,093.9 | 3,806.1 | 4,235.1 |
| (ii) | කුලී | 335.8 | 271.9 | 175.6 | 1,177.8 | 238.1 | 297.7 | 228.5 | 1,149.9 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 85.7 | 65.7 | 65.7 | - | 220.7 | 39.4 | 39.4 | - |
| (iv) | වෙනත් ආදායම් | 2,367.2 | 1,336.7 | 655.3 | 681.4 | 4,458.9 | 2,536.2 | 2,348.9 | 368.7 |
| | එකතුව | 7,879.1 | 5,981.0 | 5,010.5 | 6,227.4 | 9,878.2 | 6,967.2 | 6,422.9 | 5,753.7 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත වරිපනම් බදු ආදායම රු.5,160,501,000 ක් වූ අතර වර්ෂයේ බිල්කළ වරිපනම් ආදායම රු.4,178,035,388 ක් විය. වරිපනම් ආදායම නිවැරදිව ඇස්තමේන්තු කර නොතිබූ අතර බිල්කල ආදායමින් රු.3,679,678,051 ක් පමණක් එකතු කර තිබුණි. එකතු කර ගත් වරිපනම් බදු තුල පෙර වර්ෂ වලට අදාල හිඟ මුදල්ද ඇතුලත් වන බැවින් වරිපනම් එකතු කර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුනි. | වර්ෂය 2022 සඳහා වරිපනම් බදු ලෙස රු 4,044,860,249.ක් අයකර ඇති අතර ඒ තුළ වර්ෂයේදී 2021 ලැබූ රු 365,182,199.00 .ක අත්තිකාරම් මුදල් ද ඇතුලත් වේ . වරිපනම් බදු අයවීම් ඉහල නැංවීමට පෞද්ගලික දේපල තහනමට ගැනීම නිවාස සංකීර්ණ ආශ්‍රිතව ජංගම වැඩසටහන් පැවැත්වීම SMS මඟින් දැනුවත් කිරීම් සිදුකිරීම රජයේ දේපල වලින් හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කිරීම යනාදිය සිදුකරමින් පවතින බව. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කඩිනම් කිරීම කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂය සඳහා සිනමාශාලා 35 න් ලැබිය යුතු රු.31,664,911 ක් වූ හිඟ විනෝද බදු මුදල් අයකර ගැනීම සඳහා 2023 පෙබරවාරි 13 දින වන විටත් සභාව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ ආරම්භයේ පැවති 31,664,911 ක් වූ හිඟ සිනමා ශාලා බදු මුදලින් 2023.04.30 දිනට රු.10,329,605.02 ක මුදලක් අයකර ඇති අතර ඉතිරි හිඟ අය කර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බවට අදාළ සිනමා ශාලා වෙත ලිඛිතව දැනුම් දී ඇති බව. | කඩිනමින් හිඟ විනෝද බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් දීර්ඝ කාලීන පදනම මත බාහිර පාර්ශවයන්ට බදු දී ඇති දේපල වසර පහකට වරක් නැවත තක්සේරු කර බදු කුලිය වැඩි කිරීම සඳහා ගිවිසුම් ගතවී තිබුණත් එසේ බදු කුලිය සංශෝධනය කර නොතිබුණි. | ලේඛන ගතව ඇති බදු දේපළ සංඛ්‍යාව 53 කිකුලී සංශෝධනය . වකර ඇති දේපල සංඛ්‍යා19 කි . ඉතිරි දේපල34 න් දේපල 26 ක කුලී සංශෝධනය කිරීම සඳහා නාගරික තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා ඇත ඉතිරි දේපල .08 ක ඇති ගැටලු නිරාකරණය කරමින් පවතින බව. | බදු ගිවිසුම් ප්‍රකාරව බදු කුලිය වැඩි කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ආයතන ලැයිස්තුව අනුව කොළඹ මහා නගර සභා සීමාවට අයත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල්, නවාතැන්පල හා ආපන ශාලා 378 ක් තිබුණද එයින් 93 ක් පමණක් හඳුනාගෙන තිබූ අතර ඉන් ආයතන 18 කින් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉතිරි ආයතන 275 පිළිබඳ පරීක්ෂා කර ක්‍රියාත්මකව පවතින බව හෝ අක්‍රියව පවතින බව හෝ තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් ඉදිරියේදී ආදායම් පරීක්ෂකවරුන් මගින් සමීක්ෂණයක් සිදුකොට අදාල ආයතන ලැයිස්තුව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව සමීක්ෂණයක් සිදුකර යාවත්කාලීන ආයතන ලැයිස්තුවක් පවත්වා ගැනීමට හා නියමිත බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | දැන්වීම් පුවරු ප්‍රදර්ශනය පිළිබඳ අංක 1713/10 හා 2011 ජුලි 05 දිනැති අතුරු ව්‍යවස්ථාවේ 26 වන වගන්තිය අනුව වලංගු බලපත්‍ර නොමැතිව හා බලපත්‍රයේ සඳහන් නියමයන් හෝ කොන්දේසි වලට පටහැනිව දැන්වීම් ප්‍රදර්ශනය සිදුකළ නොහැකි වුවත් භෞතික පරීක්ෂාවේදී හඳුනාගත් ගාස්තු ගෙවීමකින් තොරව කොළඹ 07,06,05,02 ප්‍රදේශ වල ස්ථාන කිහිපයක ඉදිකළ අභ්‍යන්තර දැන්වීම් පුවරු වලින් පමණක් සභාවට ලබාගත හැකිව තිබූ ආදායම (කඩ කාමර හැර) රු.16,009,380 ක ආදායමක් අය නොකර අත්හැර තිබුණි. | විවිධ හේතු නිසා 2019 වසරේ සිට අනවසර දැන්වීම් ඉවත් කිරීම පසුබෑමක් තිබුණද මේ වන විට විශ්ව විද්‍යාල සිසුන් යොදා සමීක්ෂණ සිදුකරමින් දැනට හඳුනාගෙන ඇති අනවසර නාම පුවරු ඉවත් කිරීමටත් පුවත් පත් දැන්වීමක් මගින් අදාල , අවසරයකින් තොරවූ පුවරු ඉවත් කිරීමේ නිවේදනයක් නිකුත් කිරීමටත් කටයුතු ආරම්භ කර ඇති බව. | අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ගාස්තු ගෙවිය යුතු සියළු දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමට හා ගාස්තු නොගෙවන දැන්වීම් පුවරු ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | නගර සභා බල ප්‍රදේශය තුල බලපත්‍ර නිකුත් නොකළ LED පුවරු විශාල ප්‍රමාණයක් ඉදිකර තිබූ අතර නියැදි භෞතික පරීක්ෂාවේදී එලෙස ස්ථාපිත කර තිබූ LED පුවරු 03 කින් පමණක් රු 2,645,000.ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | LED නාමපුවරු පිළිබඳ දත්ත රැස්කර ඇති අතර අයිතිකරුවන් විසින් බලපත්‍ර ගාස්තුව ඉතා අධික බව දන්වා ඇතඅදාළ ගෙවීම් . සිදුකරන ලෙස ලිඛිතව දැනුම් දී ඇති නමුත් ගෙවීම් පැහැර හැරීම හෝ සහනදායී තත්වයන් සලකා බැලීම සඳහා අදාල නාම පුවරු අයිතිකරුවන් තොරතුරු ලබා නොදීම නිසා එම දැන්වීම් ඉවත් කිරීම ආරම්භ කර ඇති බව. | නීත්‍යානුකූල ක්‍රමවේදයක් යටතේ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 මාර්තු මාසයේදී කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් වසා දැමූ මෝදර එලිහවුස්හි පිහිටා ඇති සතුටු උයන 2023 මැයි 15 දින වන විටත් මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කර නොතිබූ අතර වසා දමා ඇති උද්‍යානයේ කාර්ය මණ්ඩලයට 2022 වර්ෂය සඳහා වැටුප් හා අතිකාල ලෙස එකතුව රු.9,179,904 ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි. | උපකරණ ඉතා පැරණි බැවින් (වසර 35 කට වඩා) මුදල් කාරක සභාවේ නිර්දේශ අනුව නව ක්‍රමවේදයක් යටතේ පෞද්ගලික අංශය සම්බන්ධ කර ගනිමින් සතුටු උයන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.<br>අත්‍යවශ්‍ය නඩත්තු මුරසේවා කටයුතු හා පිරිසිදු කිරීමේ කටයුතු සේවකයින් විසින් ඉටු කරනු ලබන බැවින් වැටුප් වියදම නිශ්කාර්ය වියදමක් නොවන බව. | ජනතාවගේ භාවිතය සඳහා කඩිනමින් ඉඩ සලසා දිය යුතුය. |
| (ආ) | වර්ෂයේ 2017Citynet ලේකම් කාර්යාලය විසින් කොළඹ නගර සභාවට පරිත්‍යාගයක් ලෙස ලබාදීමට කටයුතු කර තිබූ ගිනි නිවන රථ දෙක හම්බන්තොට වරායට එවීමට පෙර කළ යුතුව තිබූ මධ්‍යම රජයෙන් අනුමැතිය ලබා ගැනීම මෝටර් රථ පනතේ විධිවිධාන සහ අනුකූලද යන්න හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේ හැකියාව එකී වාහන කොළඹ නගරයේ භාවිතා කළ හැකිද යන්න පිළිබඳ තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීම ආදී කටයුතු සිදු නොකොට ගිනි නිවන රථ ඉල්ලීම් කිරීම් සහ නැව්ගත කිරීම සඳහා අනුමැතිය ලබාදීම හේතුවෙන් දින 18 සැප්තැම්බර් 2017 දකුණු කොරියාවෙන් නැව්ගත කර එසේ නැව්ගත .තිබුණි කරන ලද වාහන මේ දක්වා නිදහස් කර 02 ගැනීමට හෝ ආපසු හරවා යැවීමට කටයුතු සිදු කර නොතිබුණු අවශ්‍ය දක්වා වරාය හා 15 ජුලි 2022 අතර ගුදම් ගාස්තු ලෙස රුපියල් මිලියන .ගෙවිය යුතුව පැවතුනි 135.55 | මාගම්පුර ජාත්‍යන්තර වරාය කළමනාකරණය සමග රේගු ගාස්තු සඳහා සහන ලබාදීම සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇති අතර එම ලබා දෙන සහන වල වටිනාකම නිශ්චිතව තීරණය වී නැති බව. | වරායෙන් නිදහස් කර ගැනීමට හෝ ආපසු හරවා යැවීමට කටයුතු කළ යුතුය. |

**3.2** හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී සුදුවැල්ල ප්‍රධාන ගබඩාවේ තිබූ රු.1,872,454 ක් වටිනා ටයර් 33 ක් අස්ථානගත වීම සම්බන්ධව මු.රෙ 104 පරීක්ෂණය කර තිබුණද අලාභය අය කර ගැනීමට හා වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට 2022 දෙසැම්බර් 31 දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධ පරීක්ෂණය සිදු කරමින් පවතින අතර එය අවසන් වූ විගස ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | කඩිනමින් පරීක්ෂණ සිදුකර වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන සභාවට සිදුවී ඇති අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට බොරැල්ල සුසාන භූමියේ සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ අයිතම 209 ක ඌනතා පවතින බව හඳුනාගෙන තිබුණද ඊට අදාල පාඩුව නිශ්චය කර සුසාන භූමි පාලකගෙන් හෝ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | අදාල භාණ්ඩ අයිතම 209යෙහි වටිනාකම නිශ්චය කරගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටින අතර එකී වටිනාකම නිශ්චය කර ගැනීමෙන් පසුව සුසාන භූමි පාලකගෙන් හෝ ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම පාඩුව අයකර ගැනීමට කටයුතු කරන බව. | වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන සභාවට සිදුවී ඇති අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 20 කට පෙර සිට පැවත එන රු.4,206,199ක් වූ ලැබිය යුතු ශේෂ අයිතම 07 ක් සමාලෝචිත වර්ෂය තුලදීත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විස්තරාත්මක තොරතුරු නොමැති වීම මත අයකර ගැනීමට නොහැකි වී ඇති අතර දිගින් දිගටම විමසුම් වලට භාජනය වී ඇතනිරවුල් කළ නොහැකි . ශේෂ සේ සලකා ගිණුම්වලින් ගැලපීම් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකරගෙන ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ආ) | වර්ෂ 19 ක කාලයක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල පැවත එන නිලධාරීන් අතැති මුදල් ශේෂය රු 3,195,339.ක් වූ අතර එම ශේෂ නිරවුල් කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විස්තරාත්මක තොරතුරු නොමැති වීම මත නිරවුල් කර ගැනීමට නොහැකි වීම නිසා දිගින් දිගටම විමසුම් වලට භාජනය වී ඇතනි .රවුල් කළ නොහැකි ශේෂ සේ සලකා ගිණුම්වලින් ගැලපීම් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. | නිළධාරීන් අතැති මුදල් අයකර ගැනීම විධිමත් ක්‍රමවේදයක් යටතේ ගිණුම් වලින් ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ ණයගැති ශේෂ තුළ අක්‍රීයව පවතින ගිණුම් **4862** කට අදාලව රු.**466,586,610** ක ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. | කොළඹ මහා නගර සභාව තුල භෞතිකව නොමැති පොදු වෙළඳපල **07** ක ගිණුම් අංක **709** ට අදාල රු . **24,678,932.16** ක මුදලක් කපා හැරිම සඳහා කටයුතු කරමින් පවතීඑසේම . අඩි**100** පාර හි පදික කඩ **414** ට අදාල රු.**50,957,617.39** ක මුදලක් ද කපා හැරිමට අවශ්‍ය කටයුතු මේ වන විට ඉටු කරමින් ඇතඉදිරියේදී හඳුනාගන්නා . ශේෂ නිරවුල් කිරීමටත් ඉතිරි ශේෂ ගිණුම් වලින් ගැලපීමටත් කටයුතු කරනබව. | අක්‍රීයව පවතින ව්‍යාපාරික ස්ථාන ටෙන්ඩර් කිරිම තුලින් ආදායමත් ලබා ගැනීමට කටයුතු කිරිම හා අක්‍රීයව පැවති කාලයට අදාලව ගිණුම්ගත කර ඇති ආදායම් විධිමත් ලෙස ගිණුම් වලින් ඉවත් කිරිමටත් කටයුතු කර ගිණුම් නිරවුල් කළ යුතුය. |
| (ඇ) | සේවක ණය ශේෂය තුල සේවකයින් **752** දෙනෙකුට අදාලව රු.**9,269,627** ක අය නොවන අක්‍රි ිය ශේෂ වටිනාකමක් පැවතුණි. | මෙම අක්‍රීය ණයගැති ශේෂ වලින් රු . **6,367,370.66**කට අදාළ ශේෂ හඳුනාගෙන ඇති අතර අය නොවන එම ශේෂ කපා හැරීමට නිර්දේශ කර ඇත . ඒ සම්බන්ධ වන කෙටුම්පත් යෝජනාව සකස් කර අවසන් අතර එමගින් එම ශේෂ හා මෙතෙක් හඳුනානොගත් ශ ේෂ කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හඳුනාගත් ශේෂ නොපමාව අය කර ගැනීම සහ අයකරගත නොහැකි ශේෂ විධිමත් ලෙස නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | නියෝජ්‍ය නාගරික තක්සේරුකරු (කොන්ත්‍රාත්) නිල වාහනයක් හිමි තනතුරක් වී නොතිබියදී අදාල නිළධාරියා විසින් මසකට ඉන්ධන ලීටර් **220** ක් සමඟ සභාවේ ඩබල් කැබ් රථයක් භාවිතා කර තිබූ අතර මහා නගර සභාවේ ධුරයන් දරමින් සිටියදී මහා නගර සභා අරමුදලින් ගෙවිය හැකි වියදම් විස්තර කෙරෙන මහා නගර සභා ආඥා පනතේ **188(1)** උප වගන්තියේ ඇතුලත් නියමයන්ට පටහැනිව වාහනය වෙනුවෙන් වියදම් දරා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ඉන්ධන, වාහන නඩත්තුව සහ රියදුරු සඳහා දරන ලද වියදම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ මහා නගර සභාවේ තක්සේරු අංශය විසින් සභා බල ප්‍රදේශයට අයත් කොට්ඨාශ 20 ක 2021 හා 2022 වර්ෂය වලට අදාල තක්සේරු ප්‍රතිශෝධන සිදුකර නොතිබූ අතර 2023 වර්ෂයේදී ක්ෂේත්‍ර පරීක්ෂාවකින් තොරව තක්සේරු ප්‍රතිශෝධනය සිදුකර තිබුණි. | Covid ව්‍යාප්තිය හේතුවෙන් රජය විසින් වර්ෂ වලට අදාල 2022 හා 2021 තිශෝධනය නොකිරීමට වරිපනම් ප්‍ර මේ නිසා පංච .තිරණය කරන ලදී මය යටතේ වසර දෙකක් වාර්ෂික ක්‍ර 20 කොට්ධාශක ප්‍රතිශෝධන කටයුතු නවතා දමා තිබුණිහිටපු වැඩ බලන . තක්සේරුකරු විසින් ඔහුගේ අභිමතය ට නියමිත කොට්ඨා 2023 පරිදිශ ක් 8 2021 හා තක්සේරු පරීක්ෂාවකින්, ක් ක්ෂේත්‍ර20 ට අදාල කොට්ඨාශ 2022 තිශෝධනය පරීක්ෂාවකින් තොරව ප්‍ර ඒ හේතුවෙන් ලැබී ඇති .කර ඇත අභියාචනා සලකා බලා නැවත තිශෝධන කටයුතු ආරම්භ තක්සේරු ප්‍ර කර ඇති බව. | කාලානුරූපීව අදාල වරිපනම් කොට්ඨාශ වල වරිපනම් ප්‍රතිශෝධන කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශයට අයත් දේපලවල නියැදි ගොඩනැගිලි සැලසුම් වාර්තා, විරෝධතා විමර්ශන වාර්තා, තක්සේරු වාර්තා, ආදීය පරීක්ෂාවේදී දේපල වල තක්සේරු කළ වාර්ෂික වටිනාකමට එරෙහිව දේපල පදිංචිකරුවන් විසින් විරෝධතාවයන් ගොනුකල අවස්ථාවලදී එම විරෝධතා විමර්ශනය කිරිම සිදු කිරිමේදී පදනම් විරහිතව වාර්ෂික වටිනාකම් අඩු කිරිම් හා වැඩි කිරිම් නිරික්ෂණය විය .තක්සේරු කිරිම්, සම්බන්ධ දූර්වල අභ්‍යාන්තර පාලනයක් පවතින බව නිරික්ෂණය වූ අතර ඒ හේතුවෙන් සභාවට ලැබිය යුතු වරිපනම් බදු මුදල් අහිමි වී තිබූ අවස්ථා නිරික්ෂණය විය. | ඉදිරියේදී එම අභියාචනා සලකා බැලීම ස්වාධින කමිටුවක් මඟින් සිදු කිරිමට අපේක්ෂා කරන බව. | දේපල තක්සේරු කිරිම් සම්බන්ධව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කාක දූපත වෙරළ උද්‍යානයේ භෝජනාගාරය 2016 සැප්තැම්බර් 01 දින සිට 2026 අගෝස්තු 31 දින දක්වා ප්‍රසම්පාදන ක්‍රියාපටියකින් තොරව පැරඩිගම් ඉවෙන්ට් මැනේජ්මන්ට් පුද්ගලික සමාගමට බදු දී තිබූ නමුත් විධිමත් දැනුම්දීමකින් තොරව 2019 අප්‍රේල් 21 දින සිට බදුකරු පරිශ්‍රයෙන් ඉවත්ව ගොස් තිබුණි. බදුකරුගෙන් අයකර ගත යුතු සම්පූර්ණ හිඟ මුදල වන රු.4,702,733 ක මුදල සභාවට වර්ෂ 2020 දෙසැම්බර් 15 දින හෝ ඊට ප්‍රථම ගෙවන ලෙසත් එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් සමාගමට එරෙහිව නඩු පවරා එකී මුදල් අයකර ගැනීමට ක්‍රියාකරන බවත් දන්වමින් සමාගම වෙත 2020 දෙසැම්බර් 01 දින ලිපියක් සභාව විසින් යවා තිබුණද ඉදිරි කටයුතු සිදුකිරිම අතහැර දමා තිබීමෙන් කොළඹ මහා නගර සභාවට රු.4,702,735 ක පාඩුවක් සිදුවී තිබුණි. | 2019 අප්‍රේල් මස මෙම ටෙන්ඩර්කරු විසින් අවන්හල පවත්වාගෙන යාම අතහැර තිබූ අතර හිඟ මුදල් හා ඔවුන්ගෙන් අයවිය යුතු අලාභය ගණනය කර නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා එම අවන්හල පවත්වාගෙන ගිය පාර්ශවය වෙත ලියාපදිංචි තැපැල මගින් එන්තර වාසි නිකුත් කල නමුත් ලිපිනය නිවැරදි නොවන බවට දන්වමින් හරවා එවා ඇත.<br>පැරඩියම් ඉවෙන්ට් මැනේජ්මන්ට් ආයතනය විසින් එකී මුදල ගෙවීමට කටයුතු නොකිරීම නිසා එම ආයතනයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අනුමැතිය ඉල්ලා මහා සභාව වෙත කෙටුම්පත් යෝජනාවක් ඉදිරිපත් කරන ලද බව. | කඩිනමින් හිඟ මුදල් හා අයවිය යුතු අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | වෙරළ උද්‍යානයේ ආරම්භයේ සිට වෙළඳාමේ නිරත වූ පුද්ගලයින් සඳහා ව්‍යාපෘතිය මඟින් වැඩ අවසන් කරන ලද වෙළඳකුටි 16 ක් දිනකට කුලිය රු.200 බැගින් හා ඊට අදාල බදු මුදල්ද සමඟ මාසිකව අයකිරිමට 2016 මාර්තු 28 දිනැති අංක 2757 දරන සභා තීරණය මඟින් අනුමැතිය ලැබී තිබු නමුත් 2016 වර්ෂයේදී පමණක් නියමිත පරිදි ගාස්තු අයකර තිබුණි. විධිමත් පරිදි කුලී මුදල් අයකර ගැනීම සිදු වුයේ නම් 2016 මැයි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා අවම වශයෙන් රු.6,624,000 ක් අයවිය යුතු වුවත් කඩකුලි ලෙස රු.1,803,464 ක් පමණක් අය වී තිබුණි. | කාක දූපත වෙරළ උද්‍යානයේ වෙළඳ කුටි වලින් අයකිරීමට තීරණය වී තිබූ දිනකට රු200 .ක මුදල ගෙවිය නොහැකි බවට අභියාචනා කිරීම හේතුවෙන් 2588 දිනැති 2022.12.28 අංක දරණ සභා අනුමැතිය මගින්මාසික කුලි මුදල රු 2,000 .ක් ලෙස සංශෝධනය කල අතර ඒ අනුව අයවිය යුතු හිඟ කුලී මුදල ගණනය කර අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | කඩිනමින් හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කොළඹ මහා නගර සභාව සතු කොළඹ 08 ඇල්විටිගල මාවතේ බොරැල්ල සුසාන භූමි පාලකගේ | සුප්‍රිම් පියුනරල් ඩිරෙක්ටර්ස් අධ්‍යක්ෂවරුන් විසින් 2021.11.02 දින නඩු අංක CA (Writ) Application | අනවසර ඉදිකිරිම් සම්බන්ධයෙන් සහ අනවසර වෙළඳාම් |

| | | |
|---|---|---|
| නිල නිවස පිහිටි භූමියේ අංක 2 දරන ඉඩම් කට්ටි සැලසුමෙහි කැබලි අංක 48 තුල පිහිටි පර්චස් 11 පමණ භූමියේ වර්ග අඩි 6000 ක මහල් දෙකක් අනවසර ලෙස ඉදිකර තිබුණි. මෙම අනවසර ඉදිකිරීම් පිළිබඳ 2022 දෙසැම්බර් 31 දින වන විටත් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම ගොඩනැගිලි තුල සුසාන භූමි පාලක විසින් පෞද්ගලික අවමගුල් සේවා ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් තිබු අතර අවභාවිතා කරන ලද නිළධාරියාට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, සභාවට සිදුවී ඇති අලාභය ලෙස නාගරික තක්සේරුකරු විසින් සිදුකරන ලද රු.41,420,687 ක තක්සේරු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | No.540/2021 යටතේ අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කොට ඇත. අභියාචනාධිකරණයේ නියෝගය මත ඉදිරි කටයුතු කරන බව. | සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමටත් අදාල නිළධාරියාට විරුද්ධව සහ අනවසරයෙන් මල්ශාලාවක් පවත්වාගෙන යාමට ඉඩදීම සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන අදාල විනය ක්‍රියාමාර්ග ගැනීමත් සභාවට සිදුවී ඇති අලාභය අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ 2015 වර්ෂයේදී රු.12,286,464 (වැට් රහිත මිල) ක් වැය කරමින් මිලට ගන්නා ලද රසායනාගාර උපකරණ භාවිතයට නොගෙන නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නැත. | පරීක්ෂණ කටයුතු සඳහා අදාල උපකරණ භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නගරයේ ඇති අවුරුදු 100 කට වඩා පැරණි ගස්වල කඳ හා මුල්වල තත්ත්වය මැනීමට හා පරීක්ෂා කිරීමට 2015 වර්ෂයේදී රු මිලියන.7.4 ක් වැය කර ඉඩම් හා පරිසර සංවර්ධන අංශය විසින් මිලදී ගෙන තිබු ගසේ ව්‍යුහය පරීක්ෂා කිරීමේ යන්ත්‍රය 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවු.9 ක් ගත වී ඇතත් භාවිතයෙන් තොරව විහාරමහාදේවි උද්‍යාන කාර්යාලයෙහි තබා තිබුණි. | යන්ත්‍රය මඟින් ලබාදෙන දත්ත විශ්ලේෂණය කල හැකි නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම සහ දත්ත විශ්ලේෂණය සඳහා යන්ත්‍රය මිලදී ගත් ආයතනය හා සාකච්ඡා කරන බව. | යන්ත්‍රය භාවිතය පිළිබඳව හැකි ඉක්මනින් නිළධාරීන් පුහුණු කරවා ගැනීම සහ මෙතෙක් කල් යන්ත්‍රය භාවිතයට ගැනීමට කටයුතු නොකළ නිළධාරීන් පිළිබඳ විනය පරීක්ෂණයක් පැවැත්විය යුතුය . |

**3.6** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොළඹ මහා නගර සභාව යටතේ වන මාදම්පිටිය පාරිසරික රසායනාගාරය සඳහා ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැති අතර 2013 වර්ෂයේදී රසායනාගාර සහකරුවන් දෙදෙනෙකු වශයෙන් තනතුරු 03 ක් අනුමත කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් අදාල තනතුරු පුරප්පාඩුව පැවතුනි. 2016 වර්ෂයේදී රසායඥවරයකු ලෙස කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් නිළධාරිනියකුගේ සේවය දින දීර්ඝ කරමින් ලබාගෙන තිබුණි. | රසායනාගාරය සඳහා අනුමත 2017 හා 2013 කාර්යමණ්ඩල වාර්තාව අනුව රසායනාගාර සහකරු තනතුරු දෙකක් අනුමත වුවත් ඒ සඳහා බඳවාගැනීමේ පරිපාටිය අනුමතව දින 2019.02.25 ඇත්තේය. 2019/2020 බඳවා ගැනීම් සිදු නොකළ යුතුය යන්න රජයේ ප්‍රතිපත්ති මත බඳවා ගැනීම් මෙතෙක් සිදුකර නොමැත. ඉහත තනතුර SLSS SLI 2006 දීප ව්‍යාප්ත බඳවා ගැනීමේ තනතුරක් වන අතර දැනට සේවාවන් පවත්වා ගෙන යාම සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම් සිදු කර ඇති බව. | පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. |

**4.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**4.1** විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිනෙන් අවසන් 31 දෙසැම්බර් 2022 ක් 28 වර්ෂය සඳහා විගණන විමසුම් 1 නිකුත් කර තිබූ අතර ඉන් විමසීම්0 ක් සඳහා පිළිතුරු සපයා නොතිබුණි . විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමේ ප්‍රමාදය මාස 02 සිට මාස 10 .ක් විය | වර්ෂය සඳහා නිකුත් 2022කළ විගණන විමසුම් ක් සඳහා 19 න්28 මේ වන විට පිළිතුරු සපයා ඔබ .වෙත පිළිතුරු ඉදිරිපත් කර ඇත ඉතිරි විගණන විමසුම සඳහා ද කඩිනමින් පිළිතුරු යොමු කරන බව. | ලබාදී ඇති කාලය තුල විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදිය යුතුය. |

**4.2** අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුල්‍ය ප්‍රකාශන අනුව සත්‍ය ආදායම රු.13,440,288,660 ක් වූ අතර අයවැයගත ආදායම රු.17,138,383,000 ක් විය. ඒ අනුව රු.3,698,094,340 ක එනම් සියයට 21.57 ක ආදායම් විචලනයක් පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | ආදායම් ඇස්තමේන්තු සත්‍ය මූලාශ්‍ර පදනම් කරගෙන තාර්කික පදනමක් මත පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (i) | පළාත් පාලන කොමසාරිස් විසින් 2020 අගෝස්තු 27 දිනැති අංක LCD/09/2019(1) දරන පළාත් ආයතන වල ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛය මඟින් උපලේඛනගත කර තිබූ ආකෘති පත්‍ර | මේ පිළිබඳව අප විසින් අයවැය ලේඛනයට 2024 ලේඛය හරහා අදාළ චක්‍ර එක් එක් දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු අයවැය 2024 කරන අතර | චක්‍රලේඛ උපදෙස් පරිදි අයවැය සකස් කර මහ සභාවට ඉදිරිපත් කළ යුතුය. |

| | |
|---|---|
| ප්‍රකාරව වාර්ෂික මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය තුල පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතු වුවත් සභාවේ 2022 වර්ෂයේ අයවැය ලේඛනය සමඟ එම ලේඛන පිළියෙල ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික අයවැය ලේඛනය නව ගිණුම් ප්‍රමිතියට සමගාමීව මෙම චක්‍රලේඛය මඟින් නියම කර ඇති කේත අංක හා ආකෘති පත්‍ර භාවිතා කරමින් පරිවර්තනය කළ යුතු බව තවදුරටත් නිරීක්ෂණය විය. | ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේ දී මෙම ආකෘති ද ඉදිරිපත්පත්‍රකරන බව. |

**LG21/11** - මුදල් පුරෝකථන වාර්තාව

**LG21/13** - විස්තීරණ ආදායම් ප්‍රකාශනය

**LG21/14** - වත්කම් හා වගකීම් ප්‍රකාශනය

**LG21/15** - ශුද්ධවත්කම්ස්කන්ධය කාශනයවෙනස්වීමේ ප්‍ර

**LG21/16** - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

## 4.3 පාරිසරික ගැටලු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංචාරක ව්‍යාපාරයට පමණක් නොව විදේශිය ආයෝජකයන්ද සලකා බලන ප්‍රධාන නිර්නායකයක් වන අපජල කළමනාකරණයක් සිදු නොවීම රටේ ස්ථායීතාවයටද ඉදිරියේදී ප්‍රභල බලපෑමක් එළඹිය හැකි තත්ත්වයක පවතී. | අපජලය මූලික පිරිපහදුව පමණක් සිදුකර දිගු දුර මුහුදට බැහැර කිරීමේ නල මාර්ගයක් සහ මුහුදේ සවිකළ )diffusers) මගින් ගැඹුරු මුහුදට මුදාහැරීම සිදු කරනු ලැබේවර්තමානයේදී . තාව අපජල පිරිපහදුවක අවශ්‍ය තිපාදන සොයා පවතින බැවින් ප්‍ර ගැනීමෙන් පසු නව අපජල පිරිපහදුවක් ඉදිකිරීමට පියවර ගන්නා බව . | අපජලය මුහුදට බැහැර කිරිමට ප්‍රථම පිරිපහදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රුක වටිනාකමකට 481.62 මිලියන. දින කොළඹ මහා 30 නොවැම්බර් 2021 ඉදිකර නගර සභාවට භාරදී තිබූ කොම්පඤ්ඤවිදිය ය තත්ත්වයේ අපජල පොම්පාගාරය නිශ්ක්‍රි .පවතින බව නිරීක්ෂණය විය<br><br>පොම්පාගාරය භාර ගැනීමෙන් පසු සිදු කරන ලද මූලික පරීක්ෂාවේදී පොම්පාගාරය හා සම්බන්ධ අධිපීඩන නල පද්ධතියට හානි සිදු වීම මෙයට හේතු වී තිබුණිඑබැවින් කොම්පඤ්ඤවීදිය . අපජල පොම්පාගාරය වෙත එකතුවන අපජලය විවෘත කාණුවක් හරහා බේරේ වැවට මුදා හැරීම තුලින් විශාල පරිසර හානියක්ද සිදුවන බව .නිරීක්ෂණය විය | මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය මඟින් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සඳහා ලබාදීමට එකඟ වී තිබූ නමුත් අරමුදල් ලබාදීම දිගින් දිගටම ප්‍රමාද වී ඇත.<br>නල පද්ධතියේ ආපදාවන්ට ලක්වූ කොටස් අලුත්වැඩියා කර පොම්පාගාරය ක්‍රියා කිරීමට කටයුතු යොදමින් පවතින බව. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයේ මල අපද්‍රව්‍ය ඍජුවම මුහුදට මුදා හැරීම වෙනුවට අපජල පවිත්‍රාගාරයක් මඟින් පිරිපහදු කර මුහුදට මුදා හැරීම සඳහා අපජල පවිත්‍රාගාරයක් වැල්ලවත්ත රොක්සි ගාඩ්න්හි ඉදිකිරීමට රුපියල් මිලියන 4360 ක කොන්ත්‍රාත්තුවක් චීන සමාගමක් වෙත පවරා කොළඹ මහා නගර සභාව, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ත්‍රෛපාර්ශ්වික ගිවිසුමකට එළඹ තිබුණි. මෙම කාර්ය සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය මඟින් මූල්‍යනය කිරීමට ගිවිසුම් ගතව තිබුණද යෝජිත ඉඩමේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශ ගබඩාවක් ඉවත් කර නොගැනීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම භාරදීමට නොහැකි වී තිබුණි.ණය ගිවිසුම අවසන් වීම හේතුවෙන් ප්‍රතිපාදන නොමැතිවීම මත කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට කටයුතු කර ඇති අතර මේ හේතුවෙන් කොළඹ නගරයේ සහ ගල්කිස්ස ප්‍රදේශයේ මල අපද්‍රව්‍ය හා බවුසර් මඟින් ගෙන එනු ලබන ද්‍රව්‍යමය අපද්‍රව්‍ය පිරිපහදු කිරීමකින් තොරව මුහුදට මුදාහරිනු ලැබේ. | කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට කටයුතු කර තිබේදැනටමත් . මූලික සැලසුම්සකස්කර ඇති බැවින් ඉදිරියේදී මූල්‍ය ප්‍රතිපාදන සොයා ගැනීමෙන් පසු අපජල පොම්පාගාරයේ ඉදිකිරීම් ආරම්භ කල හැකි බව. | ව්‍යාපෘති ප්‍රමාදවීමට වගකිව යුතු නිළධාරීන් හඳුනා ගැනීම හා අදාල ව්‍යාපෘතිය කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2264/17 හා 2022 ජනවාරි 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ 2(1) (අ) අනුව අපද්‍රව්‍ය පරිසරයට බැහැර කිරිම, තැන්පත් කිරිම හෝ මෝචනය කිරිම එකී අපද්‍රව්‍ය මඟින් පරිසරය දූෂණය නොවන ආකාරයෙන් හෝ පරිසර දූෂණය සිදු වීමට ඉඩ නොමැති ආකාරයෙන් පමණක් සිදු කළ යුතුය. ඒ අනුව පොදු පිරිපහදු පද්ධතියකට හෝ සමුද්‍රීය පිටවුම් නල මාර්ගයකට හෝ දෙකටම සම්බන්ධිත පොදු මළාපවහන ජාලයක් වෙත අපජලය හෝ අපසන්දන බැහැරලීම සිදු කිරිමේදී අපසන්දන වලට අදාලව පරාමිතීන් 32 ක් හා වර්ණ නිර්ණායක 03 ක් පරික්ෂා කළ යුතු බව ගැසට් නිවේදනය අනුව දක්වා තිබුණද මාදම්පිටිය පොම්ප මධ්‍යස්ථානයේ පිහිටි රසායනාගාරය මඟින් ප්‍රමාණවත් හා විධිමත් පරික්ෂාවකින් තොරව අපසන්දන සාගරයට මුදාහැර තිබුණි. | අදාළ ගැසට් පත්‍රයේ සඳහන් සියලුම පරාමිතීන් පරික්ෂා කිරීම සඳහා අවශ්‍ය උපකරණ ඒ්වායේ ධාරිතාවන් සේවකයන් ප්‍රමාණවත් නොවේ. බැර ලෝහ පරික්ෂාව සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය වල මිල අධික බැවින් බැර ලෝහ සම්බන්ධ පරික්ෂාවන් සිදුකරනු නොලබන අතර ප්‍රධානම පරාමිතීන් 04 පමණක් පරික්ෂා කිරිම සිදු කරන බව. | ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාර විධිමත් ලෙස පරික්ෂාවන් කර බැහැර කිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | රසායනාගාරයට අනුයුක්තව සේවය කරනු ලබන පොම්පාගාර සේවකයින් දෙදෙනෙකු විසින් ලබා ගන්නා අපසන්දන සාම්පල් මත තීරණ ගැනීමේ අවදානමක් පවතින බැවින් රසායනඥවරියගේ සෘජු අධීක්ෂණය යටතේ සාම්පල් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතු වුවද පොම්ප මධ්‍යස්ථානයට පැමිණෙන බවුසර් වලින් නියැදි ලබා ගැනීම සම්බන්ධයෙන් විද්‍යාත්මක විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර , ඒ හේතුවෙන් පරිසරයට අහිතකර අපජලය මුදාහැරීමේ මෙන්ම නිළධාරීන්ට හා මිකතා වලට අවස්සේවකයන්ට අක්‍රථාව ලබාදීමක්ද සිදුවී තිබුණි . | ගලි බවුසර රථ වලින් සාම්පල ලබා ගැනීමට සේවකයින් දෙදෙනෙකු සහ එම අවස්ථාවේදීම PH පරික්ෂාව Digital උපකරණයක් මගින් සිදුකිරීමට සේවකයෙකු යොදවා ඇති බව. | නියැදි ලබා ගැනීම විධිමත් කිරීමත් සේවකයන් අතර දූස්සන්ධානය සිදු නොවන පරිදි ක්‍රමවත් වැඩ බෙදීමක් සිදු කළ යුතුය. |
| (iii) | අපජලය පරිසරයට මුදාහැරීමේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබාගත යුතු අතර එකී බලපත්‍රයේ දක්වා ඇති නිශ්චිත කොන්දේසි හා නියම වලට යටත්ව පමණක් අපසන්දන පරිසරයට බැහැර කිරිම සිදු කළ යුතු වුවත් කොළඹ මහා නගර සභාව විසින් අපසන්දන බැහැර කිරිම් වලට අදාලව බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රය )EPL) ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | කඩිනමින් අදාල බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iv) | පොම්ප මධ්‍යස්ථානයෙන් අපජලය බැහැර කිරීම සඳහා කොළඹ මහා නගර සභාව ලබාදෙන අවසර පත්‍රයේ 9 වන වගන්තිය අනුව පරීක්ෂා කරනු ලබන අපසන්දන මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතියට අනුකූල නොවන විට අදාල ආයතනයේ අපසන්දන ලබා ගැනීම අත්හිටුවීම සිදුකළ යුතු අතර නැවත අපසන්දන ලබා ගැනීම සිදු කළ යුත්තේ අපසන්දන පාරිසරික ප්‍රමිතින්ට අනුකූල බවට සහතික කරමින් මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් සහතිකයක් නිකුත් කිරීමෙන් පසුව පමණක් වුවත් කොළඹ මහා නගර සභාව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2021 ජුනි මාසයේදී ප්‍රමිතියෙන් තොර අපජලය පොම්ප මධ්‍යස්ථානයට මුදාහැර ඇති බව අනාවරණය වීමෙන් පසු 2021 ජුලි 28 දින ආයතන 13 ට අදාල බලපත්‍ර අත්හිටුවා තිබුණද ඉන් ආයතන 08 ක් බලපත්‍රය අත්හිටුවීමෙන් පසුවද ආසන්න මාස 05 තුල බවුසර් 842 ක අපජලය පොම්ප මධ්‍යස්ථානයට අඛන්ඩව මුදාහැරීම සිදුකර තිබුණි. | ධාරණ සීමා ඉක්මවන ලද ගලි බවුසර අයිති සමාගම් සතු සියලුම බවුසර 2021.07.28 දින බලපත්‍ර අත්හිටුවා තිබුණද ඉදිරියේදී ධාරණ සීමාවන්ට අනුකූල නොවූ අපජල සාම්පල හමුවූ විට අදාල බලපත්‍ර අත්හිටුවීම, අවලංගු කිරීම, අසාදු ලේඛනගත කිරීම හා නැවත බලපත්‍ර ලබාදීම මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ මත සිදුකිරීම යන එකඟතාවයන් මත අවලංගු කළ බලපත්‍ර නැවත බලාත්මක කිරීමට ක්‍රියාකර ඇති බව. | ප්‍රමිතියට අනුකූලව බැහැර කිරීම් සිදුකිරීම සඳහා ගලි බවුසර් වලින් සාම්පල් ලබා ගැනීම හා නිවැරදිව පරීක්ෂා කිරීම මෙන්ම ප්‍රමිතියට අදාල නොවන සාම්පල වලට අදාල බලපත්‍ර අහෝසි කිරීම සිදු කිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කළ යුතුය. |